# පාරිසරික තත්වයන් මත මානව සෞඛ්‍ය තත්වයේ වෙනස් වීම පිළිබඳ අධ්‍යයනයක් - සපුගස්කන්ද තෙල් පිරිපහදුව ආශ්‍රිත ප්‍රදේශය.

*ADKS විජේතුංග[1] WDNS ඉන්ද්‍රජිත් [2] RMT නිල්මිණි [3] WMK සංජීවනි [4] UKM සවින්දයා [5] PGN නිසංසලා [6] VO ලියනගේ [7]*

තෙල් පිරිපහදුවක් යනු, බොරතෙල් පිරිපහදු කර විවිධ ඛනිජ නිෂ්පාදන බවට පත් කරන කාර්මික ක්‍රියාවලියකි. සපුගස්කන්ද තෙල් පිරිපහදුව ශ්‍රී ලංකාවේ පිහිටා ඇති එකම තෙල් පිරිපහදුව වේ. එය කොළඹ නගරයට කිලෝමීටර 15ක් උතුරින් සපුගස්කන්ද නගරය තුළ පිහිටා ඇත.මෙම අධ්‍යයන ගැටලුව තුළින් සපුගස්කන්ද තෙල් පිරිපහදුව අවට ප්‍රදේශයේ සිදුවන පාරිසරික වෙනස් වීම මත ජනතාවගේ සෞඛ්‍ය තත්වය විශ්ලේෂණය කිරීම අරමුණ වී ඇත. මෙහිදී දත්ත රැස්කිරීම සඳහා අහඹු නියැදි ක්‍රමය යොදා ගැනිණි. මූලික දත්ත රැස් කිරීමේ ක්‍රමවේදය ලෙස ප්‍රශ්නාවලි හා සම්මුඛ සාකච්ඡා ක්‍රමය භාවිත කරන ලදී. එසේම ද්විතීයික දත්ත එකතු කිරීමේ ක්‍රමවේද ලෙස පර්යේෂණ පත්‍රිකා, අන්තර්ජාල මූලාශ්‍ර යොදා ගන්නා ලදී. අධ්‍යයනයේ දී ප්‍රදේශය තුළ හඳුනා ගත් පාරිසරික ගැටලු ලෙස තෙල් පිරිපහදුවේ තෙල් ටැංකි උණුසුම් වීමත් සමග ප්‍රදේශයේ පාරිසරික උෂ්ණත්වයෙහි වෙනස්කම් ඇති වීම, උදෑසන කාලයේදි ප්‍රදේශයේ බහුල මීදුම් තත්වයක් දක්නට ලැබීම, වර්ෂා අවස්ථාවන්හි අකුණු තත්වයන් බහුල වීම, ප්‍රදේශයේ භූගත ජලයට තෙල් මිශ්‍ර වී තිබීම මගින් ළිං ජලය අපිරිසිදු වීම වැනි ගැටලු බහුල වශයෙන් දක්නට ලැබිණි. ප්‍රදේශයේ භූගත ජලයට තෙල් මිශ්‍ර වී තිබීම හේතුවෙන් ජනතාව බොහෝ දෙනා ළිං ජලය වෙනුවට නළ ජලය භාවිතයට යොමු වී සිටියහ. තෙල් පිරිපහදුවෙන් නිකුත්වන දුමාරයට කළු පැහැති දුවිලි අංශු එක්ව තිබීම දක්නට ලැබුණු අතර එය ප්‍රදේශයේ වාතය දූෂණය වීමට හේතු කාරකයක් වී ඇත. එමගින් අධික දුර්ගන්ධයක් ප්‍රදේශය පුරා පැතිර තිබීම හඳුනා ගත හැකි විය. සුළං හැමීමේ දිශාව හේතුවෙන් පිරිපහදුවට දකුණින් පිහිටා ඇති ප්‍රදේශයට මෙම බලපෑම වැඩි වශයෙන් ඇති වී තිබිණි. මෙම ගැටලු ප්‍රදේශයේ ජනතාවගේ සෞඛ්‍ය තත්වය වෙත බලපෑම් එල්ල කර තිබුණි. දීර්ඝ කාලීනව ප්‍රදේශයේ ජනතාව අධික දුර්ගන්ධයට නිරාවරණය වී සිටිම හේතුවෙන් එම දුර්ගන්ධයට ජනතාව අනුගතව සිටි බව අවබෝධ කර ගත හැකි විය. ජනතාව හා කුඩා දරුවන් අතර දීර්ඝ කාලීන ශ්වසන රෝග ව්‍යාප්තිය හා ශ්වසන අපහසුතා දැකගැනීම සුලබ කරුණක් විය. එසේම ප්‍රදේශයේ ජනතාව අතර මුඛය සහ ගෙල ප්‍රදේශය ආශ්‍රිත පිළිකා රෝග වැළඳීමේ ප්‍රවණතාවයක්ද අධ්‍යයනය තුළදි හඳුනාගත හැකි විය. පිරිපහදුව පවත්වා ගෙන යාමේදි ප්‍රදේශයේ ජනතාවගේ සෞඛ්‍ය තත්වය පිළිබද අවධානය යොමු කරමින් පිරිපහදුව මගින් පරිසරයට නිකුත් කරන වායු තත්වයේ හා ජලයේ ප්‍රමිතිය නියාමනය කළ යුතුය.

**මුඛ්‍ය පද -** *තෙල් පිරිපහදුව, සපුගස්කන්ද ප්‍රදේශය, පාරිසරික වෙනස් වීම, සෞඛ්‍ය තත්වය, ශ්වසන රෝග*

---

12 ශ්‍රී ලංකා රජරට විද්‍යාලය, ksandeepani21@gmail.com
34 ශ්‍රී ලංකා රජරට විද්‍යාලය,
567 ශ්‍රී ලංකා රජරට විද්‍යාලය,